ඔබ යමක් (අපවිත්රතාවයක්) දුටු කල්හි ඇයව තුන්වරක් හෝ පස්වරක් හෝ ඊටත් වඩා වැඩි වාර ගණනක් ජලය හා මසන් කොළ භාවිතා කර සෝදා හරින්න. එහි අවසානයට කපුරු - කපුරු ස්වල්පයක්- යොදන්න. ඔබ අවසන් කළේ නම් මට දැනුම් දෙන්න." ඇය මෙසේ පැවසුවාය: "අපි අවසන් කළ කල්හි එතුමාණන්ට දැනුම් දුන්නෙමු. එවිට එතුමාණෝ එතුමාණන්ගේ සළුව අප වෙත දමා එය ඇයට පළන්දන්නැයි පවසා සිටියේය

උම්මු අතිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: නබි
(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ දියණියක් අභාවයට පත් වූවාය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පිටතට පැමිණ මෙසේ ප්රකාශ කළහ. ඔබ යමක් (අපවිත්රතාවයක්) දුටු කල්හි ඇයව තුන්වරක් හෝ පස්වරක් හෝ ඊටත් වඩා වැඩි වාර ගණනක් ජලය හා මසන් කොළ භාවිතා කර සෝදා හරින්න. එහි අවසානයට කපුරු - කපුරු ස්වල්පයක්- යොදන්න. ඔබ අවසන් කළේ නම් මට දැනුම් දෙන්න." ඇය මෙසේ පැවසුවාය: "අපි අවසන් කළ කල්හි එතුමාණන්ට දැනුම් දුන්නෙමු. එවිට එතුමාණෝ එතුමාණන්ගේ සළුව අප වෙත දමා එය ඇයට පළන්දන්නැයි පවසා සිටියේය. "ඇය තවදුරටත් මෙසේ වාර්තා කරයි. "ඇගේ හිසකෙස් අපි
ගෙතුම් තුනකින් සැකසුවෙමු." [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ දියණියක් වූ සෙයිනබ් (රළියල්ලාහු අන්හා) තුමිය මරණයට පත් වූවාය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඇයව නාවන්නට බලන කාන්තාවන් අතරට පිවිස "ජලයෙන් හා මසන් කොළවලින් වාර තුනක් හෝ පහක් හෝ ඊට වැඩි වාර ගණනාවක් හෝ එහි අවශ්යතාවක් ඇති වූ විටෙක ඔත්තේ සංක්යාවකින් සෝදා හරින්න. අවසන් සේදීමේ දී කපුරු ස්වල්පයක් භාවිත කරන්න. ඔබ අවසන් කළේ නම් මා වෙත දැනුම් දෙන්න." යැයි පැවසුහ. අපි ඇයව නාවා අවසන් කළ කල්හි එතුමාණන්ට දැනුම් දුන්නෙමු. සෝදා පිරිසිදු කරන ලද එතුමාණන්ගේ සළුව පිරිනමා ඇයව එමගින් ඔතන මෙන් ද ඇය ආවරණය කරන විට ඇගේ සිරුරට කෙලින්ම ස්පර්ශ වන පළමු වස්ත්රය එය බවට පත් කරන මෙන් ද පැවසූහ. පසුව ඇගේ හිසකෙස් කොටස් තුනකට ගොතනු ලැබීය.

http://sunnah.global/hadeeth/si/show/1751